# කැලණිය විශ්වවිද්‍යාලය- ශ්‍රී ලංකාව
# දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

## නවක නම්නීකරණ වැඩසටහන - 2025

2024 අධ්‍යයන වර්ෂය සඳහා දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයෙහි ශාස්ත්‍රවේදී උපාධිය සඳහා ලියාපදිංචි වීමට අයදුම්කර, මේවන විට පළමු වාරික මුදල් ගෙවා අදාළ ලියකියවිලි නිසි පරිදි යොමු කරන ලද සිසුන්ට අදාළ නවක නම්නීකරණ වැඩසටහන් පහත සඳහන් පරිදි පැවැත්වීමට අදාළ සියලුම කටයුතු මේ වන විට සූදානම් කර ඇත.

| දිනය | උපාධි පාඨමාලාව | ස්ථානය | Google Map |
|---|---|---|---|
| 2025.05.31 සෙනසුරාදා | ශාස්ත්‍රවේදී | පීඨ ශ්‍රවණාගාරය, පරිගණක හා තාක්ෂණ පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය, යුනිවර්සිටි ඩ්‍රයිව් (University Drive), බුළුගහ හන්දිය, නුවර පාර, කැලණිය. | https://maps.app.goo.gl/CGcCPFdBtiLjdjLy5 |
| 2025.06.01 ඉරිදා | | | |
| 2025.06.08 ඉරිදා | | | |

මීට අදාළ ලිපි ලියාපදිංචි තැපැල් මගින් මේ වන විට අදාළ අපේක්ෂකයින් වෙත යොමු කර ඇති අතර එම ලිපියේ සඳහන් පරිදි තමන්ට අදාළ දිනයේ දී **පමණක්** ඒ සඳහා සහභාගී විය යුතුය.

මෙහි දී සිසුන් සඳහා ඉගෙනුම් කළමනාකරණ පද්ධතියට (LMS) අදාළ පරිශීලක නාමය (user name) හා මුරපදය (password) සහිත **ලියාපදිංචි තහවුරු කිරීමේ ලිපිය, ශිෂ්‍ය හැඳුනුම්පත,** ශිෂ්‍ය අත්පොත හා විෂය නිර්දේශ පොත් ලබාදීමට නියමිත බැවින් ඒ සඳහා අදාළ අපේක්ෂකයාම සහභාගීවීම අනිවාර්යය බව දන්වමි.

එසේම කැලණිය විශ්වවිද්‍යාලයේ දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය සමග ගණුදෙනු කිරීමේ දී හා සියලුම පරීක්ෂණ සඳහා පෙනීසිටීමේ දී **ශිෂ්‍ය හැඳුනුම්පත** ඉදිරිපත් කිරීම අනිවාර්ය වන අතර, **ශිෂ්‍ය හැඳුනුම්පත නොමැතිව කිසිඳු පරීක්ෂණයක් සඳහා පෙනීසිටීමට හෝ කේන්ද්‍රය සමග සිදුකරනු ලබන වෙනත් ගණුදෙනු සිදුකිරීමට හැකියාවක් නොමැත.**

තවද දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය හරහා ලබාදෙනු ලබන දේශන හා සම්මන්ත්‍රණ සඳහා සම්බන්ධ වීමට හා අදාළ පැවරුම් උඩුගත කිරීමට ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය (LMS) වෙත පිවිසිය යුතු අතර ඒ සඳහා ඔබට නියමිත පරිශීලක නාමය (user name) හා මුරපදය (password) ලබාගැනීම අත්‍යාවශ්‍ය වේ.

**ඒ අනුව ඉහත ලියකියවිලි නම්නීකරණ වැඩසටහනේ දී පමණක් අදාළ ශිෂ්‍යයා වෙත ලබා දෙන බැවින් මේ සඳහා සහභාගි වීම අනිවාර්ය බව වැඩිදුරටත් දන්වමි.**

තවද මෙම වැඩසටහන සඳහා සහභාගි වීමේදී පහත දක්වා ඇති ඇඳුමින් සැරසී පැමිණීම වඩාත් සුදුසු බව ද අවධාරණය කරමි.

පිරිමි - කලු කලිසම හා සුදු කමිසය
ගැහැණු - කලු කලිසම/කලු සාය හා සුදු බ්ලවුසය හෝ සුදු සාරිය

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය
කැලණිය විශ්වවිද්‍යාලය
2025.05.09